බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2023
--------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විද්‍යායතනයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විද්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විද්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විද්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විද්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විද්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විද්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විද්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(1) වගන්තිය හා මුදල් රෙගුලාසි 134(3) | විද්‍යායතනයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතු වුවද විද්‍යායතනය ආරම්භ කළ 2014 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණක විසින් අභ්‍යන්තර විගණනයක් සිදුකර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී ගත් තීන්දුවට අනුව අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමේ වැඩපිළිවෙලක් පිළිබඳව අපෙක්ෂාවෙන් සිටින බව. | අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර එම වාර්තාවන්හි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛය | | | |
| (i) | 4.2 (ඌ) මාර්ගෝපදේශය | යම් වර්ෂයක් තුළ අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් එවැනි රැස්වීම් පවත්වා නොතිබුණි. | සියලුම විශ්වවිද්‍යාල විද්‍යායතනයන් හි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයේ මූලිකත්වයෙන් පැවැත් වෙන අතර 2022 වර්ෂය සඳහා වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම 2024 පෙබරවාරි 15 වන දින පැවැත්වූ බව. | චක්‍රලේඛ ප්‍රකාරව වර්ෂයක් තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 4ක් අවම වශයෙන් පැවැත්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 6.6 මාර්ගෝපදේශය | විද්‍යායතනය ආරම්භ කළ 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම ආයතනයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලයේ වාර්ෂික වාර්තාව යටතේ පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන බව. | අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී මාස 5ක් ඇතුළතදී වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.5,283,353 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,145,926 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,862,573 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මුළු ආදායම රු.5,873,844 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විද්‍යායතනයේ 2020, 2021, 2022 වර්ෂවල බඳවාගත් සිසුන් 556 දෙනෙකුගෙන් අදාළ පාඨමාලා සම්පූර්ණ නොකර අතරමග හැරයන ලද සිසුන් 60 දෙනෙකු වූ අතර ඔවුන් සඳහා ආසන්න වශයෙන් එකතුව රු.මිලියන18 ක පමණ වියදමක් විද්‍යායතනය දරා තිබුණි. එහෙත් පාඨමාලා අතරමග හැරයාම අවම කර ගැනීම කෙරෙහි ඉහළ කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි. | සිසුන් පාඨමාලා හැරයාම අවම කර ගැනීම සඳහා ශිෂ්‍ය උපදේශකවරුන්, ආචාර්ය මණ්ඩලය හා පරිපාලන අංශය එක්ව ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කරන ලද අතර 2024 වර්ෂය තුළ මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව. | සිසුන් පාඨමාලා හැරයාම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට කළමනාකාරීත්වයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් අක්කර 05 ක ඉඩමක 2016 ඔක්තෝබර් 18 වන දින සිට බටංගල විද්‍යායතනය ස්ථාපිත කර තිබුණද විගණිත දිනය වන 2024 මාර්තු 06 දින දක්වාම එම ඉඩම පවරාගැනීමේ කටයුතු අවසන් කිරීමට අපොහොසත් වී තිබුණි. | 2016 වසරේ සිටම පවරා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇති අතර මේ වන විට පවරා ගැනීම සඳහා අවශ්‍ය මිනුම් කටයුතු අවසන්ව ඇති බව. | විද්‍යායතන වෙත කඩිනම් පවරා ගැනීමේ කටයුතු සිදු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සිසුන් විභාග සමත්වීම පිළිබඳ සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අදාළව 2019 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කණ්ඩායම් සඳහා පැවති විභාග 12 කදී, මොඩියුල 19 ක් සඳහා පළමු වතාවට විභාගයට පෙනී සිට සමත් වීමේ ප්‍රතිශතය හා අවස්ථා 29 කදී නැවත විභාගයට පෙනී සිට සමත්වීමේ ප්‍රතිශතය සියයට 0 සිට සියයට 50 දක්වා වූ පහළ මට්ටමක පැවතුණි. | සිසු සිසුවියන්ගේ ඉංග්‍රීසි භාෂාවට හා පවතින දුර්වලතා මඟහැර ගැනීම සඳහා ඉදිරියේදී ඉංග්‍රීසි භාෂාවේ ප්‍රගුණතාවය වැඩි දියුණු කිරීමට සහ පුනරීක්ෂණ වැඩටහන් හරහා විභාග ප්‍රතිඵල ඉහළ දැමීම සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලබන බව. | සිසුන්ගේ පවතින දුර්වලතා හඳුනා ගෙන එම දුර්වලතා මගහැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |
| (ආ) | බාහිර කථිකාචාර්යවරුන් සඳහා සැලසුම් කරන ලද පැය ගණනට සාපේක්ෂව සම්පූර්ණ කරන ලද පැය ගණන සම්බන්ධයෙන් සිදු කරන ලද නියදි පරීක්ෂාවේදී සම්පූර්ණ කරන ලද පැය ගණන සියයට 27 සිට සියයට 53 දක්වා පහළ | බාහිර කථිකාචාර්යවරුන් ආයතන පිහිටි ප්‍රදේශය වෙත ගමන් කිරීමේදී ඔවුන්ට සිදුවන අපහසුතාවන් හා දැරීමට සිදුවන වියදම මෙන්ම දේශන පැවැත්වීම | බාහිර කථිකාචාර්යවරුන් වෙනුවෙන් සැලසුම් කරන ලද දේශන පැය |

| | | | |
|---|---|---|---|
| | මට්ටමක පැවතීම හේතුවෙන් සිසුන්ට ලැබෙන විෂය දැනුමේ ප්‍රමාණාත්මකභාවය හා ගුණාත්මකභාවය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත්විය නොහැකිය. | වෙනුවෙන් පැයකට ගෙවනු ලබන ගාස්තුව ප්‍රමාණවත් නොවීම වැනි කරුණු හේතුකොට ගෙන ඇතැම් මොඩියුල සඳහා බාහිර කථිකාචාර්යවරුන් මාර්ග ගත ක්‍රමය ඔස්සේද පැවැත්වීමට තම මනාපය පළකරනු ලබන බව. | ප්‍රමාණය සම්පූර්ණයෙන් ඉටුකරවා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ඇ) | 2022 දෙසැම්බර් මාසයේ පවත්වන ලද තොරතුරු තාක්ෂණ පාඨමාලාවට අදාළ කණ්ඩායම් දෙකක පිළිතුරු පත්‍ර 114ක් අඩංගු පැකැට්ටුවක් 2023 අප්‍රේල් 06 වන දින අස්ථානගත වී තිබුණි. ඒ හේතුවෙන් ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා එම පිළිතුරු පත්‍ර වලට අදාළ සිසුන්ගේ සිදුකර ඇති කාර්යය පැවරුම් පදනම් කරගෙන ප්‍රතිඵල නිකුත්කර තිබූ අතර එම ප්‍රතිඵල නිකුත් කිරීමට මාස දෙකක කාලයක් ප්‍රමාද වී තිබුණි. | මේ කරුණු සම්බන්ධයෙන් අප විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් පහත සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කරනු ලබන බව. සියලු අභ්‍යන්තර කථිකාචාර්යවරුන් සඳහා පිළිතුරු පත්‍ර ඇගැයීම විශ්වවිද්‍යාල විද්‍යායතන තුළදීම සිදුකිරීම.<br>සියලුම බාහිර කථිකාචාර්යවරුන්ගේ පිළිතුරු පත්‍ර ඇගැයීම සඳහා රැගෙන යාමට ප්‍රථම ඒවායෙහි (Scan copies) විභාග අංශය භාරයේ තබාගෙන විශ්වවිද්‍යාල විද්‍යායතනයෙන් පිටතට ගෙන යාමට අවසර ලබාදෙන බව. | පිළිතුරු පත්‍ර ඇගයීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

### 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 අගෝස්තු 24 දින විද්‍යායතනයේ ආගන්තුක සත්කාර කළමනාකරණ විද්‍යාගාරය සඳහා නිපුණතා ආංශික සංවර්ධන ව්‍යාපෘතිය මඟින් රු.464,400 ක් වටිනා නාන කාමර උපාංග ලබාදී තිබුණද 2024 මාර්තු 06 විගණිත දිනය වන විටත් ඉහළ කළමනාකරණය විසින් නාන කාමරයක් ඉදිකිරීමට කටයුතු නොකිරීම තුළින් එම උපකරණ නිසි අයුරින් භාවිතා කිරීමට නොහැකි වී නිෂ්කාර්යව පැවතුණි. සමාලෝචිත වර්ෂය තුළ දී එම කාර්යය සම්පූර්ණ කිරීමට නොහැකි වීම හේතුවෙන් 2020 සිසුන් කණ්ඩායම සඳහා මෙතෙක් තම පුහුණුවීම් කටයුතු සම්පූර්ණ කිරීමට හැකි වී නොතිබුණි. | ආගන්තුක සත්කාර කළමනාකරණ විද්‍යාගාරය සඳහා අවශ්‍ය නාන කාමරය ඉදිකිරීම සඳහා මේ වන විට සුදුසු ස්ථානයක් තෝරා ගෙන ඇති අතර ඒ සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති බව. | පාඨමාලාවලට අදාල ප්‍රායෝගික පුහුණුවීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විද්‍යායතනයේ පොදුවේ පවතින සේවක පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම, සේවක වැටුප්, සේවක උසස්වීම් ක්‍රමවේදයක් නොමැතිවීම, සේවක ස්ථානමාරු ක්‍රමවේදයක් නොමැති වීම හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අදාළ සේවකයින් බඳවාගත් දින සිට එකම තනතුරේ රැඳී සිටීම යනාදී සේවක ගැටළු සම්බන්ධයෙන් ඉහළ කළමනාකරණය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විශ්වවිද්‍යාල විද්‍යායතනවල පොදුවේ පවතින ගැටලු පිළිබඳව හා කාර්යය මණ්ඩලය බඳවා ගැනීම සඳහා පවතින අවශ්‍යතාවයන් පිළිබඳව අවස්ථා කිහිපයකදී ඉහළ කළමණාකාරීත්වය දැනුවත් කොට ඇති අතර ඉදිරියේදී මේ සම්බන්ධව පසු විපරම් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන බව. | පවතින සේවා ගැටළු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ගයන් ගැනීමට අවධානය යොමු කළ යුතුය. |